**උඩපළාත ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**
**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 අප්‍රේල් 06 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය.**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇතිකරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනටඋඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍යතත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මාදරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**
**--------------------------------------**

**1.3.1 නොසැසඳූ පාලන ගිණුම්.**
**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.4,582,690ක් වූ කර්මාන්ත ණයගැති වටිනාකම උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂය වූ රු.4,728,602 සැසැඳීමේදී රු.145,912 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය .

**1.3.2 ලැබිය යුතු ගිණුම්**
**--------------------**

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 02ක වටිනාකම රු.9,451,475ක් වූ අතර එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.4,868,758 ක් විය.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්.**
**----------------------**

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 03ක වටිනාකම රු.14,397,190ක් වූ අතර එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.8,432,423ක් වී තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**
**----------------------------------**

හිමිකම සනාථ කළ හැකි ඔප්පු/ පැවරුම් නියෝග සහ පිඹුරුපත් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.115,930,000ක් වූ ඉඩම් හා ගොඩනැගිලි විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකිවිය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති (i) රීති 193 | අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන, පරිපූරක සමඟ සසඳා බලා එක් එක් අය/වැය විෂයයන්ගේ අතිරික්තතා/ ඌනතා පිළිබඳ කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) අංක 218 | සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව පරික්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.29,594,136ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,194,657ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,399,479ක වර්ධනයක් නිරීක්ෂණය විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

එම වර්ධනය සඳහා ප්‍රභවයන් 04ක ආදායම් වැඩිවීම සහ එක් විෂයයක වියදම අඩුවීම මූලික වශයෙන් හේතුවී තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

**ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

ආදායම් විෂයයන් තුනක සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති හිඟ ශේෂය රු.5,062,752 ක් විය.

**2.3.2 වරිපනම් බදු**

(අ) සභා දේපළ වසර 05කට වරක් තක්සේරුකර වරිපනම් බදු සංශෝධනය කළ යුතු වුවත්, 2005 වර්ෂයේ තක්සේරුව මත සමාලෝචිත වර්ෂයටද වරිපනම් බදු අයකර තිබුණි.

(ආ) 2015 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.1,913,801 ක් වූ අතර, එයින් වර්ෂය තුළ අයකරගත තිබුණේ සියයට 19ක් පමණි. වර්ෂයේ බිල්කිරීම් වලින් අයකිරීම සියයට 45ක් විය.

(ඇ) හිඟ ශේෂය තුළ වර්ෂ 1-22 අතර කාලය තුළ වරිපනම් බදු ගෙවීම පැහැර හරින්නන්ගෙන් අය විය යුතු ශේෂය රු.1,742,587ක් වූ අතර මෙම මුදල් අයකර ගැනීමට 1987 අංක 15 දරණ අයවැය ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

| ආදායම් විෂයය | 2015.01.01 ට හිගය | වර්ෂයේ බිල් කළ ආදායම | අධි ගාස්තු | දුන් වට්ටම් සහ හිලව් කිරීම් | එකතු කළ ආදායම | | මුළු අය කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2015 .01.01 දිනට හිගයෙන් එකතු කළ ආදායම | 2015 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,907,049 | 1,266,687 | 96,633 | 88,640 | 364,571 | 565,398 | 2,251,759 |
| කුළී | 609,255 | 1,757,916 | 45,757 | 21,706 | 100,860 | 1,607,937 | 682,425 |
| ජල | 2,011,055 | 374,430 | -- | 9,025 | 168,087 | 79,805 | 2,128,568 |
| එකතුව | | | | | | | 5,062,752 |

### 2.3.3 ජල ගාස්තු.

2015 ජනවාරි 01 දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.2,011,055ක් වූ අතර එයින් වර්ෂය තුළ අයවීම් ප්‍රතිශතය සියයට 8ක් විය. වර්ෂය සඳහා බිල්කිරීම්වලින් අයවීම් සියයට 21ක් විය.

### 2.3.4 කඩ කාමර බදු

(i) දොළුව සති පොළෙහි සහ පොදු වෙළඳපොළ කඩකාමර 15ක් ගිවිසුමකින් තොරව බදුදී තිබුණි.

(ii) දොළුව පොදු වෙළඳපොළ කඩකාමරයක් සහ සතිපොල උඩුමහල් කඩ කාමර 06ක් බදුදීමට ටෙන්ඩර් කළද ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් වසා දමා තිබුණි. බදු කොන්දේසි පිළියෙල කර ඒවා නැවත බදුදීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,726,603ක් හා මුද්දර ගාස්තු රු.21,854,981ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

(අ) සභාව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 018100154963797 දරන ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය පුරාම සැලකිය යුතු මුදල් ශේෂයක් පැවති අතර මෙම මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමෙන් සභාවට ආදායම් ලබාගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව වෙන්දේසි කළ යුතු වූ ටොෂිබා වර්ගයේ ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් හා අත් ට්‍රැක්ටරයක් වෙන්දේසිකර නොතිබුණි.

(ඇ) 1993 අප්‍රේල් 22 දින ස්ථානමාරුවී ගිය නිලධාරියෙකු සහ 2008 නොවැම්බර් 23 දින විශ්‍රාමගිය සේවකයෙකු වෙත ලබාදී තිබූ සභාව සතු නිල නිවාස 2015 දෙසැම්බර් 31 වන විටද ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. නිල නිවාස වල පදිංචි වී සිටීම හේතුවෙන් මෙම සේවකයින් දෙදෙනාගෙන් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 7.2 වගන්තිය පරිදි 2015 දෙසැම්බර් 31 දිනට රු.145,967ක දඩ කුලියක් අයකළ යුතුව තිබුණි. ඉහත නිලධාරීන් දෙදෙනාද ඇතුළුව නිලධාරීන් 07 දෙනෙකු රජයේ නිවාසවල වසර 06 සිට 49 දක්වා කාලයක් පදිංචිව සිටින බව අනාවරණය විය.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### (අ) අනුකූලතා සහතික නිකුත් කිරීම.

2012 සිට 2014 දෙසැම්බර් දක්වා අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් 444කින් අනුකූලතා සහතික නිකුත්කර තිබුණේ ගොඩනැගිලි 18කට පමණි.

### (ආ) පරිසර බලපත්‍ර

වසර 03ක කාලයක් ඉකුත්වූ පරිසර බලපත්‍ර 15ක් 2016 ජූනි 22 වන විටත් අළුත්කර නොතිබුණි.

## 3.3 අවිධිමත් ගනුදෙනු

2015 පෙබරවාරි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය අරමුදල් යොදා ගනිමින් විදේශ සංචාරවල යෙදීම අත්හිටුවා තිබුණු අතර, අදාළ ආයතනයේ අරමුදල් ප්‍රාදේශීය ජනතාවට සුභ සිද්ධිය පිණිස යොදන ලෙසට දන්වා තිබියදී අවිධිමත් ලෙස සභාවේ මන්ත්‍රීවරු 29 දෙනෙක් 2015 මැයි 08 දින සිට 13 දින දක්වා චීනයේ පැවැත්වූ කසළ කළමනාකරණය හා ආපදා කළමනාකරණය පිළිබද වැඩමුළුවකට සහභාගීවීම වෙනුවෙන් එක් අයෙකුට රු.160,000ක් බැගින් රු. 2,720,000ක මුදලක් 2015 මැයි 08 දින සභා අරමුදලින් ගෙවා තිබුණි.මෙම මුදල වැය ශීර්ෂයකින් ගෙවා තිබූ අතර, සත්‍ය වශයෙන් විදේශගතවූ බව තහවුරු කරගෙන නොතිබුණි. එමෙන්ම මෙම සංචාරයෙන් පසු දින කීපයකින්, එනම් 2015 මැයි 15 දින සභාවේ ධූර කාලය අවසන්වී තිබූ අතර එම වියදමින් සභාවට කිසිදු ආකාරයක ප්‍රතිලාභයක් හිමිව නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**4.1 අයවැය පාලනය.**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණුඅයවැය ලේඛනයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේ දී ආදායම් විෂයයන් 06 ක සියයට 15 සිටසියයට 55 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 13 සිට සියයට 76 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). අයවැය පාලනය

(ආ). ආදායම් පරිපාලනය.

(ඇ). ආදායම් පරිපාලනය.